පොරතිවු පත්තු ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 03 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝතු 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පොරතිවු පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය, මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව නිසිපරිදි පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරන අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 16,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 1990 වර්ෂයේ සිදුවූ යුදමය වාතාවරණය යටතේ විනාශවූ රු. 2,100,000 ක් වටිනා ලීබඩු ද 2011 වර්ෂයේ ගංවතුර හේතුවෙන් විනාශයට පත්වූ රු. 192,001 ක් වටිනා පුස්තකාල පොත්ද පොත්වලින් කපා හැරීමට කටයුතු නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු රු. 30,396 ක විදුලි ගාස්තුව සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලද පොලිය වන රු. 51,584 ක ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන් පස් දෙනෙකුට ගෙවියයුතු රැඳවුම් මුදල රු. 34,666 ක් බෙරුම් කිරීමට කටයුතු නොකර 2009 වර්ෂයේ සිට දිගටම මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් තිබුණි.

(ආ) සභාවේ සේවයකර විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවියයුතු මුළු එකතුව රු. 504,000 ක් වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට හිඟව තිබුණද එය අයකර ගැනීම සඳහා කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරන තීරණ යනාදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණයවූ නීති සහ රීතිවල අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවල යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල්, ගබඩා ද්‍රව්‍ය සම්බන්ධ නිලධාරීන්ගෙන් අවශ්‍ය ප්‍රමාණයේ ඇප මුදල් ලබාගැනීම සභාපතිගේ රාජකාරියක් වුවද, එසේ ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් නැගනහිර පළාත භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය X වගන්තිය 193 | වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමඟ සංසන්දනය කර විචලනයන් සඳහා හේතු විස්තර කර ප්‍රකාශනයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තික වියදම් රු. 1,013,784 ක් වූ අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 3,274,374 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,288,158 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍ය සාධනය
--------------------------------------

(අ) සන්නිවේදන කුළුනු සඳහා ගාස්තු අයකිරීම්
-----------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදන කිරීමට නොහැකිවීම හේතුවෙන් සහා බලප්‍රදේශයේ පුද්ගලික සන්නිවේදන ආයතනවලින් ස්ථාපිත කර තිබූ සන්නිවේදක කුළුනු 02 ක් ස්ථාපිත ගාස්තු සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් ලබාගත හැකි රු. 59,000 ක් පමණ ආදායමක් අහිමි තිබුණි.

(ආ) වරිපනම් බදු
--------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ඉඩම්, ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි යනාදිය සඳහා 2014 වර්ෂට අදාල කාලපරිච්ඡේදයේදී වරිපනම් බදු සහ තක්සේරුකර අයකර ගැනීම සඳහා කටයුතුකර නොතිබුණි.

(ඇ) මුද්දර ගාස්තු
--------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) බදු ආදායම්
------------

සමාලෝචිත වර්ෂය අවසානයේදී 02 සිට 11 වර්ෂය දක්වා ගිහව තිබූනු රු. 65,703 ක බදු ආදායම අයකර ගැනීම සඳහා 2015 ජූලි 23 දින දක්වා කටයුතු කර නොතිබුණි.

3 පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය